{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
**Department of Education – North Central Province**

| ශ්‍රේණිය - 11 | තෙවන වාර පරීක්ෂණය - 2025 | කාලය : පැය 03යි |
|---|---|---|
| විෂයය : නර්තනය (දේශීය) - 44 | පත්‍රය : I - II | ඇතුළත්වීමේ අංකය ............ |

# පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. 2 | 11. 4 | 21. 4 | 31. 3 |
| 2. 4 | 12. 1 | 22. 4 | 32. 2 |
| 3. 1 | 13. 3 | 23. 3 | 33. 4 |
| 4. 3 | 14. 2 | 24. 2 | 34. 3 |
| 5. 2 | 15. 1 | 25. 1 | 35. 1 |
| 6. 4 | 16. 3 | 26. 4 | 36. 3 |
| 7. 3 | 17. 3 | 27. 2 | 37. 3 |
| 8. 2 | 18. 4 | 28. 1 | 38. 4 |
| 9. 1 | 19. 1 | 29. 3 | 39. 1 |
| 10. 3 | 20. 4 | 30. 3 | 40. 2 |

## II පත්‍රය

1.

i. තානායම්පල

ii. වීර

iii. අත්මිණිය / ගගනය

iv. බුම්මැඩිය

v. 2005

vi. දිය කැපීම

vii. පහතරට


viii. ඇම්බැක්කේ

ix. අ. චිත්‍රසේන ඩයස් මහතා
ආ. සෝමබන්ධු විද්‍යාපති මහතා

x. අ. කොහොඹා කංකාරි ශාන්තිකර්මය
ආ. පහන්මඩු ශාන්තිකර්මය

ලකුණු 1 x 12


2. i.



ii.



iii.



4 x 3

(සෑම විටම තාල සංකේත නිවැරදිව යෙදීමට ලකුණු දෙකක් පිරිනමන්න.)

3. i. ප්‍රශස්ති ගායනා

- අතිශයෝක්ති කාව්‍ය වර්ණනා වේ.
- බුදුන්, දෙවියන්, රජුන් මෙලෙස වර්ණනා කර ඇත.
- බහුලව දක්නට ඇත්තේ රාජ ප්‍රශස්ති ය.
- රජුන්ගේ තේජස, කීර්තිය, යුධ දක්ෂතා, පිරිස් බලය මේවායෙහි වර්ණනා කෙරේ.
- බොහෝ විට ප්‍රභුවරුන් රචනා කර ඇත.
- තරමක් සංකීර්ණ ලක්ෂණ ඇති භාෂා ව්‍යවහාරයකි.
- පැරකුම්බා සිරිත ලංකාවේ පළමු ප්‍රශස්ති කාව්‍යයි.
- ප්‍රශස්ති ගායකයින්, වන්දිභට්ටයින් ලෙස හඳුන්වයි.
- පසුකාලීනව රබන්, චාමර වැනි නර්තනාංග සඳහා ද යොදාගෙන ඇත.

ii. සතර බීජාක්ෂර

- සම්ප්‍රදායන් තුනෙහිම දක්නට ලැබෙන වාදනය හා බැඳුණු සංකල්පයකි.
- බෙරයකින් උපදවන මූලික අක්ෂර වේ.
- උඩරට - ගැටබෙරය - තත් ජිත් තොං නං
  පහතරට - දෙවොල් බෙරය - තත් දිත් තොං නං
  සබරගමු - දවුල - තත් ජිත් තොං නං
- තත්, තොං නුහුරු අතින් ද (වම) ජිත්, නං හුරු අතින් ද (දකුණ) වාදනය වේ.
- ඒ ඒ වාද්‍ය භාණ්ඩවල නිශ්චිත ස්ථානවලින් මෙම අක්ෂර උපදවා ගනී.
- සම්ප්‍රදායන්හි පද සහ සංකීර්ණ පද නිර්මාණය කර ගැනීමට මෙම අක්ෂර මූලික වේ.
  උදා : කස්තිරම්, ඉරට්ටි, අඩව් ...

iii. මිරැන්ඩා හේමලතා මිය

- නර්තනයෙහි ප්‍රවර්ධනයට දායක වූ දක්ෂ නර්තන ශිල්පිනියකි. ප්‍රවීණ ආචාර්යවරයෙකි.
- 1983.11.15 කැළණියේ උපත ලබයි.
- පාසලින් හා රජයේ ලලිත කලායතනයේ නර්තනය දේශීයව හදාරයි.
- අඩයාර් හි කලා ක්ෂේත්‍ර මගින් භරත නාට්‍යම් හදාරයි.
- අධ්‍යාපන අමාත්‍යංශයේ පළමු නර්තන අධ්‍යක්ෂවරියයි.
- ගිරාගම, කටුකුරුන්ද ගුරු අභ්‍යාස විද්‍යාලවල ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි.
- ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යක්ෂක ධුරය හොබවා ගුරු අත්පොත් සැකසීම, විෂයමාලා සංවර්ධනය, දුරස්ථ ගුරු පුහුණු, නර්තන වැඩමුළු, සම්මන්ත්‍රණ, පවත්වා විෂය සංවර්ධනයට කටයුතු කිරීම.
- නර්තනය පිළිබඳ ග්‍රන්ථ රචනා කළ ලේඛිකාවකි.
- මිරැන්ඩා හේමලතා කලා ආශ්‍රමය පවත්වාගෙන යාම හරහා සංචාරී චලන, රංග ධාරා, රංග රේඛා වැනි ප්‍රසංග පැවැත්වීම.
- මුද්‍රා නාට්‍ය නිර්මාණය කර ඇත.
- 1980 මෝල්ගස් නැටුම වේදිකාවට සැකසීම.
- ජාතික, ජාත්‍යන්තර සම්මානවලින් පුද ලබා ඇත.

iv. අංග රචනය

- නර්තනයකදී හෝ රංගනයක දී නළු ඇඳුමින් නොවැසෙන ශරීර කොටස් තේමාවට උචිතව වර්ණ ගැන්වීමේ ක්‍රියාවලියයි.
- මූලික අවධානය මුහුණට ලැබේ.
- මුහුණ කලාප 06කට බෙදයි. ඒ ඒ කලාපයන් හි උචිත පරිදි වෙනස්කම් කිරීම සිදු වේ.
- ප්‍රධාන අංග රචනා ක්‍රම 04කි. සරල, චරිතාංග, ශෛලිගත, විකාරරූපි යනුවෙනි.
- වර්ණ, රේඛා, හැඩතල, පරිමාණය, එළිය අඳුර දැක්වීම යන චිත්‍රකලාවේ මූලධර්ම ද සැළකිල්ලට ගනිමින් අංග රචනාව කරයි.
- ශිල්පියාගේ ආත්ම විශ්වාසය තහවුරු කිරීමත් ප්‍රේක්ෂකයාගේ රසවින්දනය පහසු කිරීමත් මෙයින් සිදු වේ.
- ප්‍රසාංගික බව ඇතිවීම, රංගාලෝකයේ දී ත්‍රිමාණ බව දැක්වීම මෙයින් පහසු කරයි.
- නිර්මාණයේ ස්වරූපය, ශිල්පියාගේ ස්වරූපය, දේශගුණික තත්වයන්, රංග වස්ත්‍ර සහ ආලෝක තත්වයන් සැළකිල්ලට ගනිමින් අංග රචනා කළ යුතු ය.
- අංග රචනා ද්‍රව්‍ය නම් කොට තිබීම. .....

v. භරත නාට්‍යම්හි සංගීතය

- දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීත ශෛලිය භාවිතා වේ.
- ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය මෘදංගය වේ.
- නට්ටුවාංගම් නම් තාලම්පට ද, වීනාව, තාම්පුරාව වැනි ස්වර වාද්‍ය භාණ්ඩ ද යොදා ගැනේ.
- වර්තමානයේ හාමෝනියම්, බටනලාව හා වයලීනය ද යොදා ගනී.
- සෑම නර්තනාංගයක් සඳහාම සංගීතය හා ගායනා යොදා ගනී.
- සංගීත ශිල්පීන් මුත්තුකාරන් ලෙස හඳුන්වයි.
- නට්ටුවාංගම්, නට්ටුවනාර් (ගුරුවරයා) විසින් වාදනය කරනු ලබයි.

ලකුණු 4 x 3

ප්‍රධාන කරුණු 04ක් හෝ ප්‍රමාණවත් තොරතුරු සපයා තිබීම සැළකිල්ලට ගනිමින් ලකුණු ලබා දෙන්න.

04. i.

- අගහස් වෙන් කිරීම, අක්යාල වෙන් කිරීම, කරල් වෙන් කිරීම.
- කප් සිටුවීම.
- රුක් පේ කිරීම / රුප්පේ කිරීම
- තොට පේ කිරීම
- මඩු සෑදීම / මඩු පේ කිරීම

ලකුණු 4

ii. අ. යක් ඇණුම

- කංකාරියේ පළමු සාමූහික නර්තනයයි.
- සියලු යක් දෙස්සන් පූර්ණ වෙස් ඇඳුමින් සැරසී සහභාගී වේ.
- ගායනය රහිත ශාස්ත්‍රීය නර්තන අංගයකි
- අයිලය ඉදිරියේ සඟ මහළු පිළිවෙල අනුව දෙපෙල සෑදී නර්තනය කරයි.
- වමතින් පොල් පන්දමත්, දකුණතින් ඊ ගසත් දරයි.
- දීර්ඝ නර්තනයකි.
- වට්ටම් සහ අඩව් අන්තර්ගත වේ.

ලකුණු 2

ආ. පත්තිනි නැටීම

- ප්‍රධාන නර්තන ශිල්පියා (කපු පත්තිනි) මේ සඳහා සහභාගී වේ.
- පත්තිනි දේවියගේ ස්වරූපයෙන් සැරසී ඉදිරිපත් කරයි. (සාරිය, හැට්ටය, සළුව, ඔටුන්න)
- ලාස්‍ය ලක්ෂණවලින් යුක්ත වේ.
- සළුව සහ සලඹ රංග භාණ්ඩ ලෙස හසුරවයි.
- ගායනා සහිත නර්තනාංගයකි.
- පද 07ක් නටා අවසානයේ සෙත් පැතීම සිදු කරයි.
- රඟ මඬලට පිවිසෙන්නේ දේවාභරණ සහිතවය.

ලකුණු 2

iii. අඹ විදමන - දොවොල් මඩුව

- නාට්‍යමය අවස්ථාවකි/පෙළපාලියකි
- හාස්‍ය රසය ජනිත කරයි.
- දෙබස්, සංවාද සහිතය.
- පත්තිනි උපතක් මින් නිරූපණය කෙරේ.
- පඬි රජු, මහළු වෙස්ගත් සක් දෙවි ප්‍රධාන චරිත වේ.
- කවි ගායනා, දෙබස්, සංවාද මෙන්ම නර්තනයෙන් ද සමන්විත වේ.

ලකුණු 2

පහන් දැල්වීම - පහන් මඩුව

- පහන් මඩුවටම සුවිශේෂී චාරිත්‍රයකි.
- පත්තිනි දේවතාවිය වෙනුවෙන් සිදු කරයි.
- නොඉඳුල් තෙල් සිඳ ඒවායෙන් පත්තිනි තොරණ, අනෙකුත් තොරන් හා මඩු භූමියේම පහන් දල්වා ආලෝකවත් කිරීම සිදු වේ.
- මේ හා සමගාමීව එදිනම පහන් මඩුව පවත්වන ගමෙහි සෑම නිවසක් ඉදිරියේම නැවුම් මල් පැලක එබඳු පහන් දැල්වීම සිදු වේ.

ලකුණු 2

5. i. අ. මාතලේ, කළුන්දෑව, කොණකලගම, හඟුරන්කෙත, පාතහේවාහැට, උඩහේවාහැට .....

ආ. කතරගම දෙවි, පත්තිනි දේවිය

ලකුණු 2x2

ii. අ. සමානතා

- පැවැත්වීමේ අරමුණ සමාන ය. (විනෝදාස්වාදය, සමාජ ශෝධනය)
- සියලු චරිත පිරිමින් විසින් රඟ දක්වයි.
- එළිමහන් රංග භූමියක් භාවිතය
- ප්‍රචලිත ප්‍රදේශයේ ප්‍රධාන නර්තන සම්ප්‍රදායෙන් පෝෂණය වී තිබීම.

ආ. අසමානතා

- පෝෂණය ලැබූ නර්තන සම්ප්‍රදායන් වෙනස් ය.
- වාද්‍ය භාණ්ඩ වෙනස් ය.
- රංග වස්ත්‍රාභරණ, වෙස් මුහුණු වෙනස්කම් සහිත ය.
- ආකෘතියෙන්, සංදර්භයෙන් වෙනස් ය.
- චරිත නිරූපණයට ගායන, වාදන, නර්තන යොදාගැනීම වෙනස්කම් සහිත ය.

ලකුණු 2x2

iii. ජසයා

- බීමතින් කටයුතු අවුල් කර ගැනීම නිසා හාස්‍යයට ලක්වීම.
- බහු භාර්යා සේවනය
- ව්‍යාජ උදාර බව / උදම් ඇනීම
- පවුලේ අඩදබර හෝ විසඳාගත නොහැකිව ගැටලුවට පත්වීම

ලෙන්චිනා

- පමණ ඉක්මවා රූපය ගැන උදම් ඇනීම
- සමාජ තත්වය ව්‍යාජ ලෙස ඉස්මතු කිරීම.
- පවුලෙහි අඩදබර
- සිතෙහි චපල බව

නොංචි

- වයසට නොගැළපෙන ලෙස කටයුතු කර හාස්‍යයට ලක්වීම
- අපිළිවෙල, අපිරිසිදු බව
- සැමියාගේ හා දරුවන්ගේ වගකීම් පැහැර හැරීම
- ලාබාල යුවතියක් සේ කටයුතු කිරීමට උත්සාහ කිරීම
- දැරිය නොහැකි තරමින් පවුල් බර දැරීම.

ලකුණු 4

ප්‍රමාණවත් ලෙස කරුණු සැපයීමට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

6. i. අ. A - මණිපුරි නර්තන සම්ප්‍රදාය B - කථක් නර්තන සම්ප්‍රදාය
C - භරත නාට්‍යම් සම්ප්‍රදාය D - කතකලි නර්තන සම්ප්‍රදාය

ලකුණු 2

ආ. B (කතක්) - තබ්ලාව D (කතකලි) - චෙන්ඩාව

ii.

- ආහාර්ය අභිනයෙන් වඩාත්ම පොහොසත් භාරතීය නර්තන සම්ප්‍රදායයි.
- වේශ නිරූපණයට විශේෂ වැදගත්කමක් ලබාදෙයි.
- ප්‍රධාන වේශ නිරූපණ ක්‍රම 05කි.
  පච්චා - කොළ පැහැය මුල්වන
  කත්ති - පිහිය සළකුණු සහිත
  තාඩි - රැවුල් යෙදීම (සුදු, කළු, රතු)
  කාරි - කළු පැහැය මුල්වන
  මිනික්කු - රන්වන් පැහැය
- මූලික අංග රචනා සැලැස්ම චෙප්පු නම් වේ. එය නර්තන ශිල්පියා විසින්ම සිදුකර ගනී.
- සංකීර්ණ අංග රචනා සඳහා පත්තුකාරන් නම් ශිල්පියා සහය වේ.
- වේශ නිරූපණය අනුව කතකලි චරිත හඳුන්වනු ලැබේ.
- ඒ ඒ වේශ නිරූපණයන්ට උචිත පරිදි රංග වස්ත්‍ර කොටස් හා ශිර්ෂාභරණ (කිරීටම්) යොදා ගනී.

ලකුණු 4

iii. A - උත්තර භාරතීය හින්දුස්ථානි සංගීත සම්ප්‍රදායයි. ලකුණු 2

මෙම සම්ප්‍රදායේ කාන්තා චරිත ලෙස රාධා සහ ගෝපිකාවන් හඳුනාගැනේ.

මණිපුරි ප්‍රාන්තයට ආවේණික අත්කම් සහිතව රංග වස්ත්‍ර අලංකාර කර ඇත.

කොළ (ගෝපිකාවන්), රතු (රාධා) විල්ලුද හැට්ට අඳී (රිෂම්පූරිට්)

| | |
|---|---|
| කොක්තුම්බි - හිසට | මයිකුම් - මුහුණ වසන වේලය |
| පෝෂ්වාන් - කෙටි දූහුල් සාය | කුමින් - බැරලයක හැඩැති සාය |
| කුණ්ඩලා - දෙකණට | සෙනකුජි - දෑතට .... |

ආදී රංග වස්ත්‍ර හා ආභරණ යොදා ගනී.

ලකුණු 2

7. i.

| | | |
|---|---|---|
| දෙරණ ලිට්ල් ස්ටාර් | හිරු සුපර් ඩාන්සර් | ගුරු ගෙදර |
| රංගාභිෂේක | සංචලන | මනෝහාරී |

ලකුණු 4

ii.

- නර්තන විෂය හැ බැඳි දැනුම, සිරිත් විරිත්, ආචාර ධර්ම
- සහයෝගීතාව, සහජීවනය, සාමූහිකත්වය
- නායකත්ව ගුණාංග, තීරණ ගැනීමේ හැකියාව, දරාගැනීමේ ශක්තිය
- විවිධ මට්ටම්වල සහභාගීත්වය සහ ජයග්‍රහණ
- ප්‍රායෝගික කුසලතා වර්ධනය
- රසඥතා වර්ධනය
- සංවේදී බව, සියුම් මිනිස් හැඟීම් සහිත වීම.
- ශාරීරික නිරෝගී බව, ප්‍රසන්න සිරුරක්

ලකුණු 4

ප්‍රමාණවත් පරිදි නිවැරදි කරුණු දක්වා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

iii. කොහොඹා කංකාරියෙන්

- විවාහ පොරොන්දු කඩ නොකළ යුතු බව
- අඹුදරුවන් රක්ෂා කළ යුතු බව
- තදබල වෛරයෙන් ශාප කිරීම් අත්හල යුතු බව
- මුල අමතක නොකළ යුතු බව

දෙවොල් මඩුව/පහන් මඩුව

- සත්ව ඝාතනය, හිංසනය නොකළ යුතු බව
- තදබල වෛරීසහගත සිතින් කටයුතු නොකළ යුතු බව
- කවර තරාතිරමක අයෙකුට වුව ද වඩාත් වැදගත් වන්නේ කායික, මානසික නිරවුල් බව හා නිරෝගී බව යන්න
- ඉක්මන් තීරණ ගැනීමේ දී දුරදිග සිතා කටයුතු කළ යුතු බව

ලකුණු 4

ප්‍රමාණවත් පරිදි නිවැරදි කරුණු දක්වා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.